**පදියතලාව ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පදියතලාව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ  මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත්වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවලට අදාළව ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.308,000ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේ දී අවසන් ගිණුම් වාර්තා සකස් කිරීමේ දී ජ'නල් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වහව උණුදිය උල්පත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව රු.449,744ක් කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර එම ව්‍යාපෘතියට අදාළව ගෙවිය යුතු අතරුඳවුම් මුදල රු.49,972ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා සකසන අවස්ථාවේ දී ජ'නල් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කර තිබූ කසළ අංගනයේ වහලය ඉදිකිරීමේ සහ වහව උණුදිය උල්පත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති දෙකෙහි වටිනාකම රු.997,716ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පිළිගනිමි. අදාළ ව්‍යාපෘති වටිනාකම් ඉදිරි වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීමේ දී ප්‍රාග්ධනිත කිරීමට කටුයුතු කරන බව. | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති ගිණුමේ සහ මුදල් පොතෙහි ශේෂය ශූන්‍යව තිබිය දී මුදල් මාරු ගිණුමේ රු.2,587,419ක බැර ශේෂයක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටුයුතු කරන බව. | - එම - |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව සැපයුම් උපකරණ වියදම (603) රු.1,051,650ක් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයන් 04ක උපලේඛන අනුව ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් අතර රු.19,453,528ක නොසැසඳීමක් පැවතුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ලේඛන නිවැරදිව යාවත්කාලීන කර නොගැලපීම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය තුළ උත්පාදනය කළ ශුද්ධ මුදල් ප්‍රවාහයේ නිවැරදි එකතු වටිනාකමට වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ එකතු කළ පසු වටිනාකම සහ වර්ෂ අවසාන මුදල් හා මුදල් සමාන දෑ අතර ද රු.9,944,447ක නොසැසඳීමක් පැවතුණි. | ඉදිරි වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ දී මෙවැනි ලිඛිත හා යතුරු ලියනයෙන් ඇතිවන දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

## 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ ලිඛිත සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | 657,916,979 | (i) ඉඩම් ඔප්පු<br>(ii) ඉඩම් ගොඩනැගිලි වටිනාකම ඇතුළත් උපලේඛන<br>(iii) දේපළ සමීක්ෂණ වාර්තා<br>(iv) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන | පිළිගනිමි. ඔප්පු 10ක් සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා සමඟ ගිවිසුම් අත්සන් කළ යුතු බැවින් ඔප්පු ලබා ගැනීමට ප්‍රමාද වී ඇත. එමෙන්ම ඉදිරියේ දී සමීක්ෂණ කටයුතු සිදුකිරීමට හා යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 7,439,570 | (i) වටිනාකම ඇතුළත් උපලේඛන<br>(ii) ස්ථාවර වත්කම් ලේඛන | උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | ලී බඩු සවිකිරීම | 10,878,888 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ක්ෂේත්‍ර ගබඩා ආදායම් | 3,360 | (i) උපලේඛන<br>(ii) ලේඛන<br>(iii) ශේෂ සනාථ කිරීම් | මෙම ගිණුම් සඳහා උපලේඛන හා ශේෂ සනාථ කිරීමේ සාධක කිසිවක් නොමැති අතර වර්ෂ 08කට අධික කාලයක සිට පැවත එන ශේෂයන් බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | ණයගැතියෝ (බදුකුලී) | 24,115 | | | |
| (ඊ) | අත ඉතිරි මුදල් | 475 | | | |
| (උ) | ලංකා බැංකු | 1,000 | | | |
| (ඌ) | අධිභාර | 1,500 | | | |
| (එ) | මුද්දර බදු | 127,275 | | | |
| (ඒ) | VAT | 9,600 | | | |
| (ඔ) | ලං.වි.ම. ණයහිමියෝ | 93,479 | | | |
| (ඕ) | ආදායම් වෙනුවෙන් තැන්පත් | 131,329 | | | |

**1.7 අනුකූල නොවීම්**

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් (EPF) පනත සහ 1980 සේවක භාරකාර අරමුදල් (ETF) පනත | දළ වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් මූලික වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මාස 05කට අදාළව සේවක අර්ථසාධක අරමුදල් රු.53,162ක් සහ භාරකාර අරමුදල් රු.7,974ක් අඩුවෙන් ගණනය කොට අරමුදල් වෙත යවා තිබුණි. | වරින් වර වැටුප් සැකසුම් නිලධාරීන් මාරුවීම මත ETF, EPF මුදල් ගණනය කිරීම් වෙනස් වී ඇති අතර මේ වන විට වැටුප් සකස් කරනු ලබන නිලධාරිනිය වෙත සේවකයාගේ දළ වැටුප පදනම් කර ගනිමින් දායක මුදල් ගණනය කිරීම සඳහා උපදෙස් ලබාදුන් බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 5(12) රීතිය | මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පිළිගනිමි. මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 59 රීතිය | සභාවේ ආදායම් පරීක්ෂකවරයා විසින් සෑම වර්ෂයක් ආරම්භයේදීම බල ප්‍රදේශය තුළ පවතින වෙළෙඳ, ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර මාර්තු 31 දිනට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. සභාවේ ආදායම් පරීක්ෂකවරයා පළාත් පාලන මැතිවරණය සඳහා අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීම සඳහා නිවාඩු ලබා සිටීම නිසා බල ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදුකිරීමට නොහැකි වූ අතර ඉදිරියේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක PT/04/2017 හා 2017 සැප්තැම්බර් 21 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 7.5 වගන්තිය | රු.100,000 සීමාව ඉක්මවන අලුත්වැඩියාවන් සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් බැකෝ යන්ත්‍රයේ රු.925,170ක් හා රු.590,000ක් වූ අලුත්වැඩියා කටයුතු 02ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී රු.100,000 සීමාව ඉක්මවා සිදුකරනු ලබන අලුත්වැඩියාවන් වලදී පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය | වාහන ඉන්ධන දහන පරීක්ෂාව මාස 12කට වරක් හෝ කිලෝමීටර් 25,000ක දුර ධාවනය කිරීමෙන් පසුව පරීක්ෂා කළ යුතු වුවත් සභාව විසින් එලෙස කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. වාහන ඉන්ධන දහන පරීක්ෂාව ඉදිරියේ දී සිදුකිරීමට නියමිත බව. | - එම - |

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,913,718 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,046,831 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම් | 2023 බිල්කළ ආදායම් | 2023 රැස්කළ ආදායම් | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම් | 2022 බිල්කළ ආදායම් | 2022 රැස්කළ ආදායම් | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| i. | වරිපනම් හා බදු | 206,000 | 202,250 | 202,250 | - | 206,000 | 228,910 | 228,910 | - |
| ii. | කුලී | 7,182,000 | 6,182,302 | 6,153,712 | 1,924,114 | 6,177,000 | 5,083,410 | 5,977,837 | 1,895,524 |
| iii. | බලපත්‍ර ගාස්තු | 322,000 | 484,325 | 484,325 | - | 276,000 | 265,175 | 265,175 | - |
| iv. | වෙනත් ආදායම් | 2,464,000 | 2,047,186 | 2,047,186 | 24,115 | 2,634,000 | 2,783,788 | 2,783,788 | 24,115 |
| | එකතුව | 10,174,000 | 8,916,063 | 8,887,473 | 1,948,229 | 9,293,000 | 8,361,283 | 9,255,710 | 1,919,639 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුලී<br>-----<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ආදායම රු.1,924,114ක් විය. | පිළිගනිමි. හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | ගිවිසුම් ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 05ක් පමණක් පනවා තිබුණි. | නව අතුරු ව්‍යවස්ථා 03ක් සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු නීත්‍යානුකූල කර ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ දී මාසිකව දිරන කසල ටොන් 10ක් සහ නොදිරන කසල ටොන් 20ක් වශයෙන් වාර්ෂික එකතුව ටොන් 360ක පමණ කසල ප්‍රමාණයක් රු.2,011,840ක වියදමක් දරා රැස්කර තිබුණි. දිරන කසල භාවිතා කරමින් කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 1,215ක් පමණ නිෂ්පාදනය කර එම තොගයෙන් කිලෝග්‍රෑම් 449ක ප්‍රමාණයක් අලෙවිකර 2023 වර්ෂයේ රු.11,225ක ආදායමක් පමණක් රැස්කර තිබුණි. | පිළිගනිමි. රජය මඟින් ගොවි ජනතාව සඳහා කාබනික පොහොර නොමිලේ වැඩි වශයෙන් ලබා දුන් හෙයින් අප ආයතනයෙන් කාබනික පොහොර ලබා ගැනීමේ ප්‍රමාණය අඩු වී ඇති බැවින් අලෙවිය අඩු වීමට එය බෙහෙවින් බලපාන ලද බව. | කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවිය ඉහළ නැංවීමේ වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ 2022 භාණ්ඩ සමීක්ෂණය මඟින් ඌණ යැයි හඳුනාගෙන තිබූ භාණ්ඩ අයිතම 33 ක් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාළ භාණ්ඩ සභාව වෙත ගෙන්වා ගැනීමට හෝ ඊට අදාළ වටිනාකම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 භාණ්ඩ සමීක්ෂණය මඟින් ඌණ යැයි හඳුනාගත් භාණ්ඩ අයිතමයන්ගේ වටිනාකම වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන භාණ්ඩ ගෙන්වා ගැනීමට හෝ වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 ජූලි 05 දිනැති තීරණ අංක 27 ට අනුව පත්කරන ලද අතුරු බදු දීම් පිළිබඳව සොයා බැලීමේ කමිටුව මඟින් ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර 19ක් අතුරු බදු දී ඇති බව හඳුනාගෙන තිබුණු අතර එලෙස අතුරු බදු දුන් කුලී මුදල ප්‍රාදේශීය සභාව වෙත ගෙවන කුලී මුදල ඉක්මවා රු.2,400 ක සිට රු.25,900 ක් දක්වා වූ පරාසයක පවතින බව නිරීක්ෂණය වූ අතර ප්‍රාදේශීය සභාව විසින් මෙම කඩ කාමර සභාව වෙත පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු ආරම්භ කළ ද පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2023 ජූලි 31 දිනැති ලිපිය මඟින් මෙම කඩ කාමර නිශ්චිතවම අතුරු බදු ලබා දී ඇති ද යන්න තහවුරු කර ගන්නා | පිළිගනිමි. ප්‍රාදේශීය සභාව විසින් තක්සේරුව මත පදනම් වූ කඩ කුලිය පමණක් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. අම්පාර පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා එම කඩ කාමර නිශ්චිතව අතුරු බදු දී ඇත් දැයි තහවුරු කරගන්නා තෙක් නැවත ටෙන්ඩර් කිරීම අත්හිටුවන ලෙද දන්වා අප වෙත ලිපියක් එවා ඇත. මේ | අතුරු බදුකරුවන් නීත්‍යානුකූල කිරීමට හෝ කඩ කාමර සභාව වෙත පවරාගෙන ටෙන්ඩර් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තෙක් නැවත ටෙන්ඩර් කිරීම අත්හිටුවන ලෙස දැන්වීම හේතුවෙන් එම කටයුතු නවතා දමා මාස 06කට අධික කාලයක් ගතව ඇති බව නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් විධිමත් විමර්ශන වාර්තාවක් ලබාගෙන අවශ්‍ය කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව පැවතුණි. | පිළිබඳව විමර්ශන වාර්තාව මෙතෙක් ලැබී නොමැති බව. | |
| (ඈ) | ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය (LDSP - PT 2) යටතේ දෙහි සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2023 ජූලි 08 සිට 2023 නොවැම්බර් 13 දක්වා කාලය තුළ රු.6,788,205 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ තොගයක් මිලදීගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට පෙර යන්ත්‍ර උපකරණ මිලදීගැනීම සඳහා ප්‍රතිපාදන ලබාදීම හේතුවෙන් මිලදී ගත් මෙම උපකරණ ගබඩාවේ සහ වාහන අංගනයේ ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර පැවති අතර මේ හේතුවෙන් වගකීම් සහතික පවතින උපකරණ භාවිතා නොකර තිබිය දී එහි වගකීම් කාලයෙන් මාස 08ක් මේ වන විටත් ඉක්මවා ගොස් තිබුණි. | පිළිගනිමි. LDSP - PT 2 යටතේ දෙහි ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමේ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ මිලදීගැනීම සඳහා පමණක් පළමු අදියරේදී මුදල් වෙන්කර ලබා දුන් අතර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සඳහා ප්‍රතිපාදන දෙවන අදියරේදී ලබා දීමට කටයුතු කරන බව දන්වා ඇති බව. | ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකර යන්ත්‍ර හා උපකරණ භාවිතයට ගත යුතුය. |
| (ඉ) | කැබ් රථ අනතුර පිළිබඳ පරීක්ෂාව | | |
| (i) | නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අංක 2184/9 දරන හා 2020 ජූලි 13 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රාදේශීය සභා සඳහා පනවන ලද රීති අංක 1.4(I) ප්‍රකාරව දිස්ත්‍රික්කයෙන් පිට වාහනය ගෙන යෑමේ දී අදාළ අවසරය නිශ්චිත ආකෘතිය මගින් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලබාගත යුතු වුවත් ඊට පටහැනිව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පෞද්ගලික කටයුත්තක් සඳහා දිස්ත්‍රික්කයෙන් පිටත මහියංගනය රෝහල වෙත ධාවනය කිරීමේ දී 2023 පෙබරවාරි 13 දින පදියතලාව මහියංගනය මාර්ගයේ 51 හංදියට ආසන්නව කැබ් රථය අනතුරකට ලක්ව තිබුණි. | පිළිගනිමි. හදිසි රෝගී තත්ත්වයකට ප්‍රතිකාර ගැනීම සඳහා යන අවස්ථාවේ දී මෙම අනතුර සිදුවී ඇත. සභාවේ සභාපතිවරයා ප්‍රතිකාර ගැනීම සඳහා මහියංගනය රෝහල වෙත යන බව දුරකථන මාර්ගයෙන් අම්පාර පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වෙත දැනුවත් කළ බව සභාපතිවරයා පවසන බව. | පළාත් පාලන කොමසාරිස්වරයා ගේ පූර්ව ලිඛිත අනුමැතියක් ලබාගත යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණයකින් පසු අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසත් ඇතුළත දී පූර්ණ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත් අනතුර සිදු වී මාස 10 ක කාලයක් ඉක්මවා තිබියදීත් අදාළ අලාභ හානියේ වටිනාකම නිශ්චය කර එවැනි වාර්තාවක් සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | අප විසින් මූලික විමර්ශන සිදුකොට ප්‍රාරම්භක වාර්තාවක් අම්පාර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමුකර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතුව පවතින රථ වාහන 07ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කර එම ආයතන වෙත ලිපි යවා ඇති බව. | භාවිතයෙන් ඉවත්කළ වාහන වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව භාරයේ පවතින වාහන 10ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | පිළිගතිමි. අදාළ ආයතන වෙත පැවරීම් කටයුතු සඳහා ඉල්ලීම් කර ලිපි යවා ඇති බව. | දැනට සභාව නමින් ලියාපදිංචි කර නොමැති වාහන සභාවේ නමට ලියාපදිංචි කරගත යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 36ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගතිමි. සුසාන භූමි වටිනාකම ඉදිරියේදී තක්සේරු කිරිමට කටයුතු කරන බව. | වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 09 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පිළිබඳව දැනුම් දී ඇති බව. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සේවක ණය ලේඛනය අනුව මියගිය නිලධාරීන් දෙදෙනෙකුගේ සහ ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ රු.226,570ක් වටිනා ණය ශේෂ 03ක් වසර 02 සිට වසර 05කට අධික කාලයක සිට අය නොවී පැවතුණි. | පිළිගතිමි. ස්ථාන මාරු වී ගිය ආයතනයක් පිළිබඳව සොයාගත නොහැකි බව, ඇපකරුවන්ගේ තොරතුරු සොයාගත නොහැකි බව හා ඉතිරි මුදල මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ ප්‍රමාණවත් නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිගනිමි. ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යය ප්‍රමාණවත් ආකාරයෙන් සිදුකිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස්කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | පිළිගනිමි. විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කිරීමට කටයුතු කරන බව. | විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කර රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව මඟින් කිරවාන ප්‍රදේශයේ පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, පරිසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ දී පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. | වලංගු පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වේ. |

**4.4 තිරසාර සංවධර්න අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගතිමි. ඉදිරියේදී මේ පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන පරමාර්ථ සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |